
## <u>වාර්ෂික ස්ථාන මාරු - 2025</u>


## <u>අභියාචනා ඉදිරිපත් කිරීමේ උපදෙස් මාලාව</u>

### (A) <u>වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත් මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා අභියාචකයන්ට උපදෙස් :</u>

01. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන් විසින් සිය අභියාචනා අයදුම්පත්‍රය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ (online) පමණක් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත **<u>2025.08.15 දින ප.ව. 11.59 ට</u>** පෙර යොමු කළ යුතුය.

02. දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියේ (www.cs.sp.gov.lk) මුල් පිටුවේ ඇති **"ස්ථාන මාරු දැනුම් දීම"** යටතේ View All වෙත පිවිස හෝ https://www.cs.sp.gov.lk/_css/csw/transfer_si.html වෙත පිවිස වාර්ෂික ස්ථාන මාරු අභියාචනා ඉදිරිපත් කිරීමට හැකියාව පවතී. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිතා කිරීම වඩාත් සුදුසු වේ. ජංගම දුරකථන භාවිතා කරමින් අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබට යම් අපහසුතාවයන් / තාක්ෂණික දෝෂ ඇතිවිය හැකිය.)





03. **කිසිදු නිලධාරියෙකු වෙනත් නිලධාරියෙකුගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත එම නිලධාරියාගේ අනුදැනුමකින් තොරව** මාර්ගගත වාර්ෂික ස්ථාන මාරු අභියාචනා තොරතුරු පද්ධතියට ඇතුළත් නොකළ යුතු ය. එසේ අදාළ නිලධාරියාගේ අනුදැනුමකින් තොරව අයදුම්පත් යොමු කිරීමක් සිදු කර ඇති බවට තොරතුරු අනාවරණය වුවහොත් එකී පුද්ගලයින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විනයානුකූල ව පියවර ගනු ලැබේ.

04. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත්‍ර මාර්ගගතව (online) යොමු කිරීම සඳහා දත්ත ඇතුළත් කිරීමට යම් ආකාරයක අපහසුතාවයක් පවතී නම් එම නිලධාරීන් විසින් <u>පෞද්ගලික ලිපිගොනු විෂය භාර නිලධාරියාගේ / ස්ථාන මාරු විෂය භාර නිලධාරියාගේ සහය ලබා ගනිමින් නිවැරදි දත්ත ඇතුළත් කිරීම සඳහා</u> හැකි උපරිමයෙන් කටයුතු කළ යුතු ය.

05. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත සඳහා තොරතුරු ඇතුළත් කිරීමේදී ඔබ හට තාක්ෂණික හෝ වෙනත් සහයක් අවශ්‍ය වන්නේ නම් **091-4944010, 091-4946365, 075-7164425 (සුරංග මයා)** දරණ දුරකථන මාර්ග ඔස්සේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු විෂය සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන්න.

## (A).01 දත්ත පද්ධතියට ඇතුළත් වීම (Log in to the System)

- පහත තිරයේ දක්වා ඇති පරිදි LOG IN මත Click කර අදාළ තොරතුරු ලබා දී ඔබගේ ගිණුමට පිවිසෙන්න.




| සම්පූර්ණ කළ යුතු තොරතුරු | උපදෙස් |
|---|---|
| **ජාතික හැඳුනුම්පත් අංකය** | නිලධාරියා විසින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් යොමු කිරිමේ දී භාවිතා කළ ජාතික හැඳුනුම්පත් අංකය ලබා දෙන්න. |
| **Password** | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් යොමු කිරීමේදි ලබා දුන් රහස් මුර පදය ලබා දෙන්න. |

- ඔබගේ මුරපදය අමතක වූයේ නම් **Forget Your Password Click Here** මත Click කර, ඔබ විසින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරිමේදී ලබා දෙන ලද ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය ලබා දුන් විට ඔබගේ මුරපදය කෙටි පණිවිඩයක් (SMS) මගින් එකී ජංගම දුරකථන අංකය වෙත යොමු කරනු ලැබේ. (ඔබට යම් සහයක් අවශ්‍ය වන්නේ නම් 091-4944010, 091-4946365, 075-7164425 (සුරංග මයා) දරණ දුරකථන මාර්ග ඔස්සේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු විෂය සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන්න.)


## (A).02 අභියාචනා අයදුම්පත් ඉදිරිපත් කිරීම (submit the appeal)

- දත්ත පද්ධතියට පිවිසි විට ඔබ විසින් ඉදිරිපත් කළ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය දර්ශනය වන අතර එහි දකුණු පස ඉහළ කෙලවරේ “අභියාචනා ඉදිරිපත් කරන්න” මත click කරන්න.

- එවිට ඔබ වෙත අභියාචනා අයදුම්පත්‍රය දර්ශනය වන අතර එහි සම්පූර්ණ කළ යුතු දත්ත ඇතුළත් කරන්න.

- ඉන් අනතුරුව submit මත click කර ඔබගේ අභියාචනා අයදුම්පත්‍රය දත්ත පද්ධතියට ඇතුළත් කරන්න.

- එසේම ඉහත අභියාචනය සමඟ ඉදිරිපත් කළ යුතු **යම් ලේඛනයක් (PDF කරන ලද) ඇතුළත් කිරීමට අවශ්‍ය නම් දත්ත ඇතුළත් කිරීමෙන් අනතුරුව ලැබෙන අයදුම්පත්‍රයෙහි පහළින් ලැබෙන සබැඳිය (Choose File) මඟින් ඇතුළත් කර submit කිරීම මඟින් එම ලේඛන දත්ත පද්ධතියට යොමු කළ හැකිය.**




- අභියාචනා අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට ඇතුළත් කළ පසුව නැවතත් කිසි විටක සංශෝධනය කළ නොහැකිය. එබැවින් සියලු තොරතුරු නැවත වරක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අයදුම්පත පද්ධතිය වෙත ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

- යම් හෙයකින් ඔබ විසින් අදාළ අයදුම්පතේ තොරතුරු නිසි පරිදි සම්පූර්ණ කර නොමැති නම් “දත්ත ඇතුළත් කරන්න” මත Click කළ ද, අයදුම්පත පද්ධතියට ඇතුළත් කිරීමට අවස්ථාව නොදෙන අතර තවදුරටත් සම්පූර්ණ කළ යුතු තොරතුරු ඔබට පෙන්වනු ලැබේ.

- ඔබගේ ස්ථාන මාරු අභියාචනා අයදුම්පත් අංකය SP_TRANSFER කෙටි පණිවුඩ සේවාව (SMS) මඟින් ඔබගේ ජංගම දුරකථනය වෙත පහත පරිදි කෙටි පණිවුඩයක් මඟින් දැනුම් දෙනු ලැබේ.

> Obage sthana maaru Abhiyachana ayadumpatha sarthakawa sampoorna karana ladi, Ayadumpath ankaya - 10

**(B) වාර්ෂික ස්ථාන මාරු අයදුම් නොකළද ස්ථාන මාරු ලද B අක්ෂරය සහිත ස්ථාන මාරු අයදුම්පත් අංක හිමි නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අයදුම්පත් මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් :**

1. 2025 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය යටතේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් කළ යුතු වුවද, එලෙස අයදුම්පත් ඉදිරිපත් නොකළ බවට අදාළ ආයතන ප්‍රධානීන් විසින් දැනුම් දී ඇති නිලධාරීන් සඳහා B අක්ෂරය සහිත ස්ථාන මාරු අයදුම්පත් අංක හිමි වන අතර, එම නිලධාරීන් හට වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබී ඇත්නම්, ඔවුන් විසින් අභියාචනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ද පහත පරිදි සිය අභියාචනා අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

2. 2025.02.05 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 දරණ 2025 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්කරුවන් සඳහා වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති **උපදෙස් මාලාව 01** ප්‍රකාරව, B අක්ෂරය සහිත ස්ථාන මාරු අයදුම්පත් අංක හිමි නිලධාරීන් විසින් නව ගිණුමක් සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරුව (REGISTER) සිය අභියාචනා අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. ඒ සඳහා ඔබගේ කාර්යාලයේ පෞද්ගලික ලිපිගොනු විෂය නිලධාරී / ස්ථානමාරු විෂය නිලධාරීගේ සහයෝගය ලබා ගන්න.


3. එලෙස ගිණුමක් සකස් කිරීමෙන් අනතුරුව ඉහත A කොටසේ දක්වා ඇති ආකාරයටම ඔබගේ අභියාචනා අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න.


4. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත සඳහා තොරතුරු ඇතුළත් කිරීමේදී ඔබ හට තාක්ෂණික හෝ වෙනත් සහයක් අවශ්‍ය වන්නේ නම් **091-4944010, 091-4946365, 075-7164425 (සුරංග මයා)** දරණ දුරකථන මාර්ග ඔස්සේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු විෂය සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන්න.

## (C) <u>අභියාචනා අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online) නිර්දේශ කිරීම සඳහා ආයතන ප්‍රධානීන් සඳහා උපදෙස්:</u>

1. වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අභියාචනා අයදුම්පත්‍රය ආසන්නතම ආයතන ප්‍රධානියා මඟින් සෘජුවම ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ (online) යොමු කිරීමට කටයුතු සකස් කර ඇත. **<u>ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ යොමු කිරීම 2025.08.19 දින ප.ව. 11.59 ට අවසන් වේ.</u>**


2. දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියේ (www.cs.sp.gov.lk) මුල් පිටුවේ ඇති **"ස්ථාන මාරු දැනුම් දීම"** යටතේ View All වෙත පිවිස හෝ https://www.cs.sp.gov.lk/_css/csw/transfer_si.html වෙත පිවිස වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සඳහා ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඉදිරිපත් කිරීමට හැකියාව පවතී. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිතා කිරීම වඩාත් සුදුසු වේ. ජංගම දුරකථන භාවිතා කරමින් අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබට යම් අපහසුතාවයන් / තාක්ෂණික දෝෂ ඇතිවිය හැකිය.)



## (C).01 දත්ත පද්ධතියට ඇතුළත් වීම (Log in)

- ඉහත ලබාදී ඇති උපදෙස් පරිදි වාර්ෂික ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් වීම සඳහා පහත තිරයේ දක්වා ඇති තොරතුරු සම්පූර්ණ කරන්න.




| සම්පූර්ණ කළ යුතු තොරතුරු | උපදෙස් |
|---|---|
| **ජාතික හැඳුනුම්පත් අංකය** | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කිරීම සඳහා ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් වීමට ඔබ භාවිතා කළ ජාතික හැඳුනුම්පත් අංකය ලබා දෙන්න. |
| **Password** | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් නිර්දේශ කිරීම සඳහා ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් වීමට ඔබ භාවිතා කළ රහස් මුර පදය ලබා දෙන්න. |

- ඔබගේ මුරපදය අමතක වූයේ නම් **Forget Your Password Click Here** මත Click කර, ඔබ විසින් පෙර ලියාපදිංචියේදී ලබා දෙන ලද ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය ලබා දුන් විට ඔබගේ මුරපදය කෙටි පණිවිඩයක් (SMS) මගින් එකී ජංගම දුරකථන අංකය වෙත යොමු කරනු ලැබේ.

- වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත සඳහා තොරතුරු ඇතුළත් කිරීමේදී ඔබ හට තාක්ෂණික හෝ වෙනත් සහයක් අවශ්‍ය වන්නේ නම් **091-4944010, 091-4946365, 075-7164425 (සුරංග මයා)** දරණ දුරකථන මාර්ග ඔස්සේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු විෂය සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන්න.

## (C).02 අභියාචනා අයදුම්පත්‍ර නිර්දේශ කිරීම. (Recommendation of the Appeals)

- දත්ත පද්ධතියට ඇතුළත් වීමෙන් අනතුරුව ඔබ වෙත ලැබී ඇති අභියාචනා අයදුම්පත් දර්ශනය වේ.
- ඒ අනුව, ඔබ විසින් මේ වන තෙක් නිර්දේශ නොකළ අභියාචනා අයදුම්පත් නිල් පැහැයෙන් දිස්වන අතර ඔබ විසින් නිර්දේශ ඉදිරිපත් කර අවසන් කළ අභියාචනා අයදුම්පත් කොල පැහැයෙන් දිස්වේ.
- අභියාචනා අයදුම්පත් පරීක්ෂා කරන්න යන්න මත Click කර ඔබට අදාළ නිලධාරීන්ගේ අයදුම්පත පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ තොරතුරු ඔබ විසින් සම්පූර්ණ කර “Submit” මත Click කිරීම මඟින් අදාළ අභියාචනා අයදුම්පත සෘජුවම ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු වේ.